# ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

# වැවල - හොරණ

## <u>අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

මෙම මණ්ඩපයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලබා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල දැනට **ස්ථිර සේවයේ නියුතු තනතුරෙහි තහවුරු කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර ගත් අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරි/ අධ්‍යක්ෂ/ මණ්ඩපාධිපති මගින් 2025.09.24 දින හෝ ඊට පෙර ලැබෙන සේ **<u>ලේඛනගත තැපෑලෙන් ශ්‍රීපාලි මණ්ඩපයේ නියෝජ්‍ය ලේඛකාධිකාරි</u>** වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත් ප්‍රතිකෙෂ්ප කරනු ලැබේ.

01. තාක්ෂණික නිලධාරි (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණිය

සුදුසුකම් :

(i) අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙහි ඕනෑම විෂය ධාරාවක් යටතේ එක වරකදී විෂයයන් තුනක් සමත්ව තිබිය යුතුය.

සහ

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ / තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාලව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ National Vocational Qualification 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතික පත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

සටහන : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාල රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය** : U – MT1(III ) - රු.51,095–7x540;10x640- 60,575/- මාසික

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත පරීක්ෂණයක් හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

02 තාක්ෂණික නිලධාරි (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

සුදුසුකම් :

1. අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙහි ඕනෑම විෂය ධාරාවක් යටතේ එක වරකදී විෂයයන් තුනක් සමත්ව තිබිය යුතුය.

සහ

2. (අ). තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ජාතික වෘත්තිය නිපුනතා (National Vocational Qualification) 5 වෙනි මට්ටම (NVQ Level 5) නොඅඩු නිපුනතා සහතිකපත් ලබා තිබීම.

හෝ

(ආ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ඉහත (2) (අ) කොටසෙහි සුදුසුකම් වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමග පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : U – MT1(III ) - රු.51,095–7x540;10x640- 60,575/- මාසික

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත පරීක්ෂණයක් හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

03. බංගලා භාරකරු හා අරක්කැමි ( III ශ්‍රේණිය )

සුදුසුකම් :

1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ තනතුරට අදාලව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (NVQ Level) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කල යුතුය).

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

3. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාල ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග අවම වශයෙන් වසර පහක (05) පලපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : U – PL 2(III ) - රු.44,575–16x490- 52,415/- මාසික

**බඳවා ගැනීමේ ක්‍රමය :** වෘත්තිය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

04 . රියදුරු (III ශ්‍රේණිය)

සුදුසුකම් :

1. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබිය යුතුය.

සහ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත සේවකයෙකු වීම.

**වැටුප් පරිමාණය** : U – PL 3(III ) - රු.48,005–16x490- 55,845/- මාසික

**බඳවා ගැනීමේ ක්‍රමය :** වෘත්තිය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශ්‍රීපාලි මණ්ඩපය,
වැවල,හොරණ
10.09.2025